| | |
|---|---|
| ගිවිසුම් අංකය | |
| දිනය | |

**<u>ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියත් විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් ඒකාබද්ධව සහ විදේශගත වන රටවිරු ශ්‍රමිකයා අතර ඇති කර ගනු ලබන ගිවිසුම් පත්‍රයයි.</u>**

ණය මුදල රු.......................................................................................................................

මෙහි පහත පළමු පාර්ශවය යයි කියනු ලබන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්ෂ 1995 අංක 30 දරණ පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් (මින් මතු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් හැදින්වෙන) වෙනුවෙන් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට අනුබද්ධ සමෘද්ධි මහා සංගමයේ කළමණාකාර අධ්‍යක්ෂ / සමෘද්ධි කළමණාකරු (මින්මතු පළමු පාර්ශවය වශයෙන් හැදින්වෙන) එක් පක්ෂයකට ද,

මෙහි දෙවන පක්ෂය යැයි කියනු ලබන ණයලාභියා වන ( මෙය මින්මතු විදේශගතවන රටවිරු ශ්‍රමිකයා වශයෙන් හැදින්වෙන) පළමු පාර්ශවයේ ඉතිරි කිරීමේ (රටවිරු නිවාස ණය ක්‍රමය) ගිණුම් අංක....................................දරණ..........................................................................හි පදිංචි.....................................................(ජා.හැ.අංකය....................................) යන එකී ණයකරු ගේ (මෙහි පහත සදහන් කාරණාවලදී,වගකීම්වලදී හා අදහස් වන තැන්වලදී එකී ණයලාභියා ගේ උරුමකරුවන්, පොල්මංකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් ,පැවරුම්කරුවන් දඇතුලත් වන්නේය යන අදහස තේරුම් ගැනීම හා ඒත්තු ගැනීම ඇතිව ) එක් පක්ෂයකට බැදී වර්ෂ 20...........ක් වූ .....................මස..............දින............................................හි දී ඇති කරගනු ලබන ගිවිසුමයි.

එකී ගිවිසුමේ කොන්දේසි කවරේද යත්,

1) ඉහත කී ගිවිසුම ප්‍රකාරව පලමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත ස්ථිර නිවසක් ඉදි කර ගැනීම සදහා දෙන ණය මුදලක් බව දෙපාර්ශවය පිළිගනී.

2) ඉහත කී ගිවිසුම ප්‍රකාරව දෙවන පාර්ශවය විසින් එකී ණය මුදල ලබා ගැනීම සඳහා ඔහුට/ඇයට හෝ ඔවුන්ගේ කලත්‍රයාට නීත්‍යානුකූල අයිතිය ඇති ඉඩමක් තිබිය යුතු බව දෙපාර්ශවය පිළිගනී.

3) ඉහත කී ගිවිසුම ප්‍රකාරව අවිවාහකව දෙවන පාර්ශ්වය විදේශගත වන්නේ නම් ඔහුට හෝ ඇයට අළුතින් නිවසක් ඉදි කරවා ගැනිමේදී එකි ඉඩමේ අයිතිය දෙමව්පියන් සතු වූ විට ඔවුන්ගේ කැමැත්ත ලබා ගැනීම අනිවාර්ය බව දෙවන පාර්ශ්වය පිළි ගනී.

4) ඉහත කී ගිවිසුම ප්‍රකාරව එකි ඉඩම පළමු පාර්ශ්වය වෙත උකස් කිරීමේදී ඒ සඳහා ඇටෝර්නි බලය පැවරීම ඉහත සදහන් පුද්ගලයන් වෙත ලබාදීමට දෙවන පාර්ශ්වය එකග වේ.

5) ඉහත කී ගිවිසුම ප්‍රකාරව දෙවන පාර්ශ්වය සමෘද්ධි බැංකු සංගමයක සාමාජිකයකු වන්නේ නම් දැනට ලබා ගෙන ඇති ණය තිබේනම් එකී ණය ශේෂය පැවතියද නිවාස ණය ලබා ගැනීමට හැකි බව දෙපාර්ශ්වය පිළිගනී.

6) ඉහත කී ගිවිසුම ප්‍රකාරව එකී ණය මුදල මුල් අදියරේ දී නිවසක් ඉදිකිරීම සඳහා පමණක් ලබා දෙන බව දෙවන පාර්ශවය පිළිගනී.

7) ඉහත කී ගිවිසුම ප්‍රකාරව පලමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය සඳහා රුපියල් ලක්ෂ තුනක (300000/) මුදලක් ලබා දීමට එකග වේ.

8) ඉහත කී ගිවිසුම ප්‍රකාරව දෙවන පක්ෂය විසින් ගනු ලබන ණය මුදලට වාර්ෂිකව 10%ක පොළියක්ද සමග සමාන වාරික 60කින් (එනම් අවුරුදු 05ක් ඇතුලත) ගෙවීමට එකග වේ.

9) ඉහත කී ගිවිසුම ප්‍රකාරව මාසික ණය පොළිය හීනවන ශේෂ ක්‍රමයට අනුව පොළිය ගණනය කරන බව දෙපාර්ශවය පිළිගනී.

10) යම් හෙයකින් ඉහත කී ගිවිසුම ප්‍රකාරව මාසය අවසානයේ දී එකී ණය වාරිකය ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක ණය ගෙවන දිනට සමෘද්ධි බැංකු සංගමයට අය විය යුතු හිඟ වාරික මත 5%ක දඩ පොළියක් නියමිත පොළී ප්‍රතිශතයට අමතරව සමෘද්ධි මහ සංගමය වෙත ගෙවීමට දෙවන පක්ෂය එකඟ වේ.

11) ඉහත කී ගිවිසුම ප්‍රකාරව දෙවන පාර්ශවය සමෘද්ධි බැංකු සංගමයේ සාමාජිකත්වය දරනු ලබන අයෙකු වීමත් එසේ නොවන ඉල්ලුම්කරන පුද්ගලයා සමෘද්ධි බැංකු සංගමයේ කොටස් ගිණුමක් විවෘත කර එහිදී ද අවමය වශයෙන් කොටස් දෙකක් සම්පුර්ණ කිරීම අනිවාර්ය බව දෙපාර්ශවය පිළිගනී.

12) ඉහත කී ගිවිසුම ප්‍රකාරව දෙවන පාර්ශවය විසින් වානිජ බැංකුවක අනේවාසික විදේශ මුදල් ගිණුමක් විවෘත කල යුතු බවට පිළිගනී.

13) ඉහත කී ගිවිසුම ප්‍රකාරව දෙවන පාර්ශවය විසින් අනේවාසික විදේශ මුදල් තැන්පතු ගිණුමේ අංකය , බැංකුව ආදී තොරතුරු පලමු පාර්ශවය වෙත ලබාදීමට එකග වේ.

14) ඉහත කී ගිවිසුම ප්‍රකාරව හෝ ඒහා සම්බන්ධිත තොරතුරු පලමු පාර්ශවය ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක පලමු පාර්ශවයේ නියෝජිතයාට ලබාදීමට දෙවන පාර්ශවය ගිවිසුමෙන් බැඳී සිටින බවත්, තෙවන පාර්ශවයන් වෙත එම තොරතුරු ලබා දීමේ අයිතිය සමෘද්ධි බැංකු සංගමය සතු වන බව දෙවන පාර්ශවය පිළිගනී.එමෙන්ම අවශ්‍ය ඕනෑම වේලාවක ව්‍යාපෘතිය පරික්ෂා කිරීමට පලමු පාර්වයට ඇති අයිතියද දෙවන පාර්ශවය පිළිගනී.

15) ඉහත කී ගිවිසුම ප්‍රකාරව විවාහක දෙවන පාර්ශ්වය ණය ඉල්ලුම් කිරීමේදී සමෘද්ධි බැංකු සංගමයේ ගිණුමක් ආරම්භ කළයුතු අතර එහි පසු අයිතිය කලත්‍රයාට ලබාදීමට දෙවන පාර්ශ්වය එකග වේ. එසේම කලත්‍රයා නොමැති අවස්ථාවකදී වයස අවු 18 ට වැඩි දරුවකු ණය මුදල සඳහා සම්බන්ධ කර ගැනීම අනිවාර්ය බව දෙවන පාර්ශ්වය පිළිගනී.

16) ඉහත කී ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය හෝ ඒ සම්බන්ධිත චංචල හා නිශ්චල වත්කම් සඳහා රක්ෂණ හිමිකම් ලබාගැනීම / යාවත්කාලීන කිරීම දෙවන පාර්ශවයේ වගකීමක් වන අතර, අදාල රක්ෂණ හිමිකම පළමු පාර්ශවයේ නමට ලබා ගත යුතු අතර, යම් ආපදාවකදී , හානියක දී එකී රක්ෂණ හිමිකම් ප්‍රතිලාභ/ ආවරණය පළමු පාර්ශවයට හිමි වන අතර, එම අයිතිවාසිකම්වලට කිසිදු එරෙහි වීමක් / විරුද්ධත්වයක් පළ නොකිරීමට දෙවන පාර්ශවය එකඟ වේ.

17) ඉහත කී ගිවිසුමේ 10 වන කොන්දේසිය ප්‍රකාරව දෙවන පාර්ශ්වය විසින් නම් කරනු ලබන ළගම ඥාතියකු හෝ වෙනත් විශ්වාස වන්ත අයකුට ගිණුමේ මුදල් පරිහරණය කිරීම සඳහා බලය පැවරීමක් සිදු කළයුතු බවට දෙවන පාර්ශ්වය පිළිගනී.

18) ඉහත කී ගිවිසුම ප්‍රකාරව ණය දෙනු ලබන මුදල ආපසු ගෙවීමේ දී දෙවන පාර්ශවය මෙකී ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවක දී හෝ ණය මුදල එකවර අය කර ගතයුතු යැයි පළමු පාර්ශවයේ කළමණාකාර අධ්‍යක්ෂ හෝ/හා විධායක කමිටුව තීරණය කරන අවස්ථාවකදී දෙවන පාර්ශවය හා ඇපකරුවන් විසින් යථෝක්ත පළමු පාර්ශවයේ හෝ ඔවුන් නමින් වෙනත් මූලා

ආයතනයක පවත්වා ගෙන යනු ලබන ගිණුමක පවතින මුදලින් ණය මුදල පියවා ගැනීමට/ ගෙන්වා ගැනීමට හා/හෝ භාරයට ගැනීම, විකිණීම, කුළියට දීම හෝ වෙනත් අභිමත ක්‍රියා මාර්ගයකින් ණය මුදල පියවා ගැනීම සඳහා මෙම ගිවිසුම මගින් යථෝක්ත පළමු පාර්ශවයේ කළමණාකරුට බලය ලැබෙන බව දෙවන පාර්ශවය හා යථෝක්ත ණය මුදලේ සියළුම ඇපකරුවන් පිළිගනී. මෙකී බලය වලංගු වන්නේ නියමිත පරිදි පළමු පාර්ශවය වෙත ණය මුදල ගෙවා අවසන් කිරීමෙන් පසුව බව දෙපාර්ශවය පිළිගනී

19) ඉහත කී ගිවිසුම ප්‍රකාරව පළමු පාර්ශවය විසින් ඉහත සඳහන් නියමයන් හා කොන්දේසි හෝ අතුරෙන් යම් නියමයක් හෝ කොන්දේසියක් හෝ කොන්දේසි විරහිතව හෝ නියමයන්ට හෝ අනුකූලව අතහැර දමනු ලැබිය හැකි බව දෙවන පාර්ශවය පිළිගනී.

20) ඉහත කී ගිවිසුම ප්‍රකාරව පලමු පාර්ශවය විසින් කරනු ලන එවැනි සෑම අතහැර දැමීමක්ම පළමු පාර්ශවයේ යම් නියමයන් හා කොන්දේසි යටතේ ඇති අයිතිවාසිකම්වලට හානිකර නොවිය යුතු වන වන අතර, එම අතහැර දැමීම සිදු නොකරනු ලැබූ පරිද්දෙන් සහ පළමු පාර්ශවය විසින් යෝග්‍යයැයි අදහස් කරනු ලබන අවස්ථාවක් ක්‍රියාත්මක කරනු ලැබිව හැකි පරිදි එම අයිතිවාසිකම් සෑම විටම දෙවන පාර්ශවය එකඟ වේ.

21) ඉහත ගිවිසුම ප්‍රකාරව ඉහත සඳහන් ණය මුදල පළමු පාර්ශවය විසින් ප්‍රදානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මගෙන්/ අපගෙන් අය විය යුතු මුදල් දැක්වෙන්නා වූද එකී පළමු පාර්ශවයේ පොත් පත් හා ලේඛණ වලින් සම්පාදනය කොට එකී පළමු පාර්ශවයේ කළමණාකරු හෝ සහකාර කළමණාකරු හෝ වෙනත් බලයලත් නිලධාරියකු විසින් අත්සන් කොට සහතික කරන ලද්දා වූ යම් ප්‍රකාශයක් , උද්ධෘතයක්, ලියවිල්ලක් හෝ ව්‍යවස්ථාපිත නිලධාරියකු ඉදිරියේ කරනු ලබන්නේ නොමැතිව පළමු පාර්ශවය වෙත ඇති මාගේ බැරකම් පිළිබඳ මුදල් සම්බන්ධයෙන් තීරණාත්මක සාධකයක් වශයෙන් සැලකිය යුතු වන්නේය.

22) එකී ගිවිසුම් ප්‍රකාරව ණය මුදල මෙම ගිවිසුමේ සඳහන් කොන්දේසි යටතේ පලමු පාර්ශවය වෙත ණය මුදල් ගෙවා අවසන් වන තෙක් ගිවිසුම වලංගුව පවතින බව දෙපාර්ශවය පිළිගනී.

ඊට සාක්ෂි පිණිස ඉහත කී ගිවිසුමට පළමු පක්ෂය වෙනුවෙන් සමෘද්ධි කළමණාකාර අධ්‍යක්ෂ.....................................................වන මමද, දෙවන පක්ෂය වෙනුවෙන් ..................................................................වන මම / අප ද වර්ෂ ................ක් වූ......................මස..................දින ..........................................හිදී අත්සන් තැබුවෙමු.

පළමු පාර්ශවය

.............................

කළමණාකාර අධ්‍යක්ෂ/

සමෘද්ධි කළමණාකරු

දෙවන පාර්ශවය

............................

ණයකරු/ණයකරුවන්

සාක්ෂි :-

1.

2.